රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 03/2016

මගේ අංකය : EST-7/UNIFO/06/V
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2016.08.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රියදුරු සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් හා මැහුම් කුලිය

ඉහත කරුණට අදාළ වන 2013.04.22 දිනැති 05/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ සඳහන් පරිදි කාර්යාල සේවක සේවයේ නිලධරයන් සඳහා නිල ඇඳුම් දීමනාව ලබා දීම සම්බන්ධව විවිධ ආයතන විසින් විටින් විට මා වෙතින් විමසීම් කර ඇත. ආයතන සංග්‍රහයේ XXI පරිච්ඡේදයේ විධිවිධාන හා මේ වන විට නිල ඇඳුම් හා මැහුම් කුලිය ලබා දීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි විධිවිධාන පරිදි කාර්යාල සේවක සේවයේ පහත සඳහන් තනතුරුවල සේවයේ නිරත නිලධරයන් සඳහා පමණක් නිල ඇඳුම් හා මැහුම් කුලී දීමනාව හිමිවන බව දන්වා සිටිමි.

I. කාර්යාල සේවක සේවයේ II ශ්‍රේණියේ නිලධරයන්
II. I ශ්‍රේණියට පත් කර ඇතත් II ශ්‍රේණියේ තනතුරක සේවයේ යොදවා ඇති කාර්යාල සේවක සේවයේ නිලධරයන්
III. අමාත්‍යාංශයක ආරච්චි තනතුරු නාමය ලබා දී, එම තනතුරෙහි රාජකාරි කරන කාර්යාල සේවක සේවයේ නිලධරයන්
IV. මුරකරු

03. එමෙන්ම කාර්යාල සේවක සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව, ඒ ඒ ශ්‍රේණිවලට අයත් තනතුරු පහත පරිදි වේ.

| ශ්‍රේණිය | තනතුර |
|---|---|
| විශේෂ ශ්‍රේණිය | ප්‍රධාන කාර්යාල කාර්ය සහායක (ආරච්චි) |
| I ශ්‍රේණිය | දුරකථන ක්‍රියාකරු |
| | ලේඛන භාරකරු |
| | පොත් බඳින්නා |
| | අනුපිටපත් යන්ත්‍ර ක්‍රියාකරු |
| | ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු |
| II ශ්‍රේණිය | කාර්යාල කාර්ය සහායක |
| | බයිකල් පණිවුඩකරු |
| | පණිවුඩකරු |
| III ශ්‍රේණිය | කාර්යාල කම්කරු |
| | අමදින්නා |
| | උද්‍යාන කම්කරු |
| | කාර්යාල මුරකරු |
| | සනීපාරක්ෂක කම්කරු |

04. ඉහත කරුණු කෙරෙහි ඔබේ අවධානය යොමු කර, නිල ඇඳුම් හා මැහුම් කුලිය සඳහා හිමිකම් ලබන නිලධරයන්ට පමණක් එම දීමනාව ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය